(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 5.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2020 ජනවාරි 21 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද අමරවීර මහතා,** ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ සබඳතා අමාත්‍යතුමා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමා සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්ද මහතා,** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිළුම් අමුණුගම මහතා,** ප්‍රවාහන සේවා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** විදුලිබල රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** දේශීය වෛද්‍ය සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී සම්පත් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත පෙරේරා මහතා,** ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුභසාධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මහාමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සංවර්ධන බැංකු හා ණය යෝජනා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** වරාය සංවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි** මහතා

ගරු **වජිර අබේවර්ධන** මහතා

ගරු **අශෝක් අබේසිංහ** මහතා

ගරු **ජෝන් අමරතුංග** මහතා

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන** මහතා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම** මහතා

ගරු **ජේ. සී. අලවතුවල** මහතා

ගරු **ආනන්ද අලුත්ගමගේ** මහතා

ගරු **රංජිත් අලුවිහාරේ** මහතා

ගරු වසන්ත අලුවිහාරේ මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු දුනේෂ් ගන්කන්ද මහතා
ගරු චන්දිම ගමගේ මහතා
ගරු දයා ගමගේ මහතා
ගරු පියසේන ගමගේ මහතා
ගරු සිරිපාල ගමලත් මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු අනුරාධ ජයරත්න මහතා
ගරු ලකී ජයවර්ධන මහතා
ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
ගරු එම්. එස්. තෞෆික් මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු වීරකුමාර දිසානායක මහතා
ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා
ගරු එස්. බී. නාවින්න මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු කේ. කේ. පියදාස මහතා
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
ගරු සුජිත් සංජය පෙරේරා මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු තිලක් මාරපන මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු බිමල් රත්නායක මහතා
ගරු සාගල රත්නායක මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
**ගරු රුවන් විජයවර්ධන මහතා**
**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**
**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
**ගරු ධුලිප් විජේසේකර මහතා**
**ගරු හේෂා විතානගේ මහතා**
**ගරු එස්. වියාළේන්දිරන් මහතා**
**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
**ගරු කුමාර වෙල්ගම මහතා**
**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
**ගරු සන්දිත් සමරසිංහ මහතා**
**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
**ගරු මුත්තු සිවලිංගම් මහතා**
**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**
**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
**ගරු සුජීව සේනසිංහ මහතා**
**ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මහතා**
**ගරු වසන්ත සේනානායක මහතා**
**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**
**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**
**ගරු රවුෆ් හකීම් මහතා**
**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
**ගරු කබීර් හෂීම් මහතා**
**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
**ගරු ඩී. බී. හේරත් මහතා**
**ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා**
**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**
**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්
නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්
කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්
ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත මේ වනවිට ලැබී ඇති, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 වර්ෂයේදී සිදු කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධව විමර්ශනය කර ඒ සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීමට පත් කරන ලද විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි අදාළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳව පිළියෙළ කරන ලද ව්‍යෝහාරික විගණන වාර්තාව පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරයන්ගේ දැනගැනීම පිණිස පාර්ලිමේන්තුවේ සභාගත කරන ලෙස මන්ත්‍රීවරයන් බොහෝ දෙනෙකු විසින් 2020 ජනවාරි 03 වැනි දින සභාගර්භයේදී සහ ඉන් පිටතදීත් දිගින් දිගටම කරන ලද ඉල්ලීම් ද, 2020 ජනවාරි 13 වැනි දින පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන් හා දේශපාලන පක්ෂවල නියෝජිතවරයන් මා සමඟ පැවති රැස්වීමේදී කරන ලද ඉල්ලීම් ද, සැලකිල්ලට භාජනය කර ඒ සම්බන්ධව මාගේ තීරණය පාර්ලිමේන්තුවට දැනුම්දීමට මම අදහස් කරමි.

2015 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ප්‍රශ්නගත භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවට අදාළව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2016 වර්ෂයේදී සිදු කරන ලද විමර්ශනයේදී, එකී භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් සිදුකොට ඒ තුළින් රජයට සිදුවූ නිශ්චිත අලාභය හෝ පාඩුව කොපමණද යන්න සොයාගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් නිර්දේශ ලබාදී තිබුණි.

ඉන් අනතුරුව, මෙකී භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳව විමර්ශනයන් සිදු කරන ලද විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයවීමෙන් මෙකී භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳව 'ව්‍යෝහාරික විගණනයක්' සිදු කිරීමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් ලබා දෙනු ලබන වාර්ෂික වාර්තාව සහ එකී ගිණුම් පිළිබඳ නිරීක්ෂණයන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සලකා බලන ලද අවස්ථාවේදී, මෙම ව්‍යෝහාරික විගණනය පැවැත්වීම හා ඊට සම්බන්ධ කටයුතු, එහි ක්‍රියාදාමයන් සහ ඊට වැයවන පිරිවැය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් කාරක සභාව හමුවේ විස්තරාත්මකව කරුණු දැක්වීම් ද සිදුකරන ලද බව අනාවරණය කරගන්නා ලදී.

එවැනි විගණනයක් සිදුකිරීම සම්බන්ධව විශේෂ නිපුණතාවයක් හා සුදුසුකම් ඇති ජාත්‍යන්තර පාර්ශ්වයක් විසින් සිදුකරන ලද එම ව්‍යෝහාරික විගණනයට අදාළ අවසන් වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබී තිබූ අතර එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස එකී කාරක සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව කරන ලද ඉල්ලීමට අනුව නීතිපතිවරයාගේ උපදෙස් පරිදි, භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධව පැවැත්වෙන සහ ඉදිරියේදී පැවැත්වීමට නියමිත අධිකරණ ක්‍රියාදාමයන්ට අගතියක් නොවන අයුරින් එකී කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ට පමණක් ලබාදීම සඳහා එම වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

ඉන් අනතුරුව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මෙම වාර්තාව සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් කැඳවීමට කටයුතු සූදානම් කර තිබූ නමුදු, 2019.12.02 දින අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය, වාරාවසාන කිරීමත් සමඟ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග විධිවිධාන ප්‍රකාරව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ක්‍රියාත්මකවීම අහෝසි විය.

අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නැවත ස්ථාපිත කොට එම කාරක සභාව විසින් මෙම වාර්තාව සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට

තවත් සැලකිය යුතු කාලයක් ගතවීමට ඉඩකඩ ඇති බැවින් එකී කාරක සභාව ක්‍රියාත්මකව නොපවතින මෙම කාලය තුළ එවැනි කාරක සභාවන්හි භාරකරු ලෙස මා වෙත පැවරී ඇති බලතල සහ වගකීම්, මා විසින් මෙහිදී සැලකිල්ලට භාජනය කරන ලදී.

ඒ අනුව, විශේෂයෙන් මහජන මුදල් පාලනය පිළිබඳ පූර්ණ බලය පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති බවට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන ද, විශේෂයෙන්ම ඒ සම්බන්ධව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සතු බලතල ද සමඟ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 136 ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල මෙන්ම පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් කිසිදු බාහිර පාර්ශ්වයකගේ මැදිහත්වීමකින් තොරව ස්වාධීනව තීරණ ගැනීමේ අයිතිය අවධාරණය කරමින් මාගේ පූර්වගාමී, හිටපු කථානායක ගරු අනුර බණ්ඩාරනායක මහතා විසින් ලබාදෙන ලද ඓතිහාසික තීරණය ද මෙහිලා විශේෂයෙන් සැලකිල්ලට භාජනය කරන ලදී.

එලෙසම, මෙම ව්‍යෝහාරික වාර්තාව පිළියෙළ කිරීම සඳහා ජාත්‍යන්තර සහ දේශීය මට්ටමේ විශේෂඥයන්ගේ සහාය ලබාගැනීමට විශාල පිරිවැයක් දරා ඇති බැවින් මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ට පමණක් ලබාදීමට වඩා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මන්ත්‍රීතුමන්ලා වෙත ලබාදීම යෝග්‍ය බව මම විශ්වාස කරමි.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව ප්‍රකාරව තොරතුරු වෙත ප්‍රවේශවීමේ මූලික අයිතිවාසිකම කෙරෙහි ද ම'විසින් මෙහිදී අවධානය යොමු කරන ලද බවත් සඳහන් කරනු කැමැත්තෙමි.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධව වූ 'ව්‍යෝහාරික විගණන වාර්තාව' අද දින සභාගත කිරීම යෝග්‍ය බවට මම තීරණය කරමි.

තවද, මෙම භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවට අදාළව දැනටමත් ආරම්භ කර තිබෙන සහ ඉදිරියේදී ආරම්භවීමට නියමිත අධිකරණ ක්‍රියාමාර්ග විධිමත් හා නීත්‍යානුකූල තත්ත්වයන් යටතේ පවත්වාගෙන යාමට මෙම තීරණය කිසිදු ආකාරයකින්, එකී අධිකරණමය ක්‍රියා මාර්ගයන්ට බාධාවක් හෝ බලපෑමක් සිදුවීමට අවකාශයක් ඇති නොවන බව මාගේ විශ්වාසයයි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්—

(i) 2016 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්, 2018.03.01 සිට 2018.10.26 දක්වා කාලයට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2019.10.23 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව

නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්—

(i) 2019 අංක 6 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2019.11.01 සිට 2019.11.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූලි 10 දිනැති අංක 2131/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 09 දිනැති අංක 2135/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 10 දිනැති අංක 2135/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vi) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 01 දිනැති අංක 2151/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වා, එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන සහ නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2019 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස මේජර් ජනරාල් (විශ්‍රාමික)

හේරත් මුදියන්සේලාගේ උදය බණ්ඩාර හේරත් මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 23 දිනැති අංක 2137/96 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට 2019 දෙසැම්බර් 13 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස සම්මානිත මහාචාර්ය වීරකෝන් මුදියන්සේලාගේ අබේරත්න බණ්ඩාර මහතා පත් කිරීම සම්බන්ධයෙන් සහ 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 2142/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පරිච්ඡින්න කරමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 13 දිනැති අංක 2153/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2019 දෙසැම්බර් 13 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා අබේවික්‍රම ලියනගේ මහත්මිය පත් කිරීම සම්බන්ධයෙන් සහ 2019 නොවැම්බර් 07 දිනැති අංක 2148/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පරිච්ඡින්න කරමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 13 දිනැති අංක 2153/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වා, එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු සන්දිත් සමරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ කටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සිට 25 දක්වා සහ අංක 29 සිට 46 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී 27 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. තේරීම් කාරක සභාව (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පවත්නා සභාවාරයේ සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහහත් දෙනෙකුගෙන් (17) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. තේරීම් කාරක සභාව (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පහත නම්

සඳහන් සාමාජික මන්ත්‍රීවරයන් දහහත් දෙනා (17) පවත්නා සභාවාරය තුළදී මෙකී තේරීම් කාරක සභාවේ සේවය කළ යුතුය:—

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු මනෝ ගනේසන් මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි, ගරු සිසිර ජයකොඩි මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"1952 අංක 44 දරන උඩරට විවාහ හා දික්කසාද පනත ඉවත්කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙත පවරන ලදී.

**8. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1) :** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ණඇ) සහ 61(1)(ණඇ) වගන්ති යටතේ ශ්‍රී ලංකා ජලජ තීරය තුළ මසුන් සහ ජලජ සම්පත් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 03 දිනැති අංක 2008/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අ.භා. 2.51 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.21 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතුය''යි, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.56 ට ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

''ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය යුතුය''යි, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.54 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2) :** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 28 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61 වගන්තිය යටතේ ධීවර මෙහෙයුම්වල දී උල් කරන ලද කූරු භාවිතා කිරීම තහනම් කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 03 දිනැති අංක 2008/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3) :** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 29 සහ 61(1)(ද) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 61 වගන්තිය යටතේ තඹුවා මත්ස්‍ය විශේෂය ඇල්ලීම තහනම් කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අප්‍රේල් 11 දිනැති අංක 2014/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4) :** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ද) වගන්තිය යටතේ මසුන් සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 15 දිනැති අංක 2023/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5) :** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 64(අ) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61(1)(ආ) වගන්තිය යටතේ මාදැල් මඟින් මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන

අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 05 දිනැති අංක 2065/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 6) :** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවල ධීවර කටයුතු සිදු කරනු ලබන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා වන අවම ප්‍රමිති සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 25 දිනැති අංක 2107/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 7) :** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 6, 7, 8, 9 සහ 10 වගන්ති සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර මෙහෙයුම් සම්බන්ධයෙන් කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 18 දිනැති අංක 2115/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. කල් තැබීම (දරුවන් පාසල් වලට ඇතුළත් කිරීමේ විධිමත් ක්‍රමවේදයන්) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ශ්‍රියාණි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි, කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 7.00 ට ගරු ශ්‍රියාණි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 7.18 ට, 2020 ජනවාරි 22 වැනි බදාදා අ.භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.